
(c) Sumitha Publishers

දඹදිව බරණැස් නුවර
බ්‍රහ්මදත්ත රජුගේ ඇත් ගාල
ඉතා විශාල විය.
රජුගේ මඟුල් ඇතා
තේජවන්ත පෙනුමකින් යුත් ඇතෙකි.
ඇත් ගොව්වා ඇතා හොඳින් රැක බලා ගනී.
කෑමට පොල්, කොස් වැනි කොළ වර්ග ද
කෙසෙල්, දිවුල්, කොමඩු වැනි පලතුරු වර්ග ද
උක් දඬු ද අඩුවක් නැතිව ලැබිණ.

ඇත් ගොව්වා ද ඇත් ගාලට වී තම කෑම කයි.

(c) Sumitha Publishers



දිනක් බල්ලෙක් ඇත් ගාලට පැමිණියේය.
ඇත් ගොව්වා තම බත් මුලෙන් ටිකක්
උෟට ද කන්නට දුන්නේය.
ඇතාට කෑමට දුන් කෙසෙල් ඇවරියෙන්
ගෙඩි කීපයක් බිම වැටී තිබිණ.
බල්ලා ඒවා ද කෑවේය.
ඇත් ගාල හොඳ කෑම ඇති තැනක් බව
බල්ලාට වැටහිණ.
උෟ පසුව දා ද ඇත් ගාලට පැමිණියේය.

තවත් දින කීපයක් ගත වුණු පසු
බල්ලා ඇතා සමග සෙල්ලම් කිරීමට ද
පටන් ගත්තේය.
ඇතා බල්ලා සිය හොඬවැලින් ගෙන
ඒ අතට ද මේ අතට ද පද්දයි.
බල්ලා ඇතා අසලට ම වී නිදා ගනී.

වැඩි කලක් යන්නට මත්තෙන්
ඇතාත් බල්ලාත් ඉතා හොඳ යහළුවෝ වූහ,
ගජ මිතුරෝ වූහ.

(c) Sumitha Publishers